# ඵලයෙන් හේතුව අනුමාන කිරීමේ අ/තාර්කිකත්වය:

## ධර්මකීර්ති පාදයන්ගේ කාර්ය ලිංගය පිළිබඳ විමර්ශනයක්

අසංග තිලකරත්න

### හැඳින්වීම

පර්වතයක දුම් තිබෙනු දැක ඒ අනුව දුමෙහි හේතුව වූ ගින්න එම පර්වතයෙහි පවත්නා බව නිගමනය කිරීම සප්‍රමාණ නිගමනයක් ලෙස සමස්ත ඉන්දීය තර්ක ශාස්ත්‍රය තුළම පිළිගනු ලැබේ. දුම හා ගින්න අතර ඇති සබඳතාව ඵලය හා හේතුව අතර ඇති සබඳතාවක් ලෙස ගත්විට මෙම නිගමනය වූ කලී ඵලය කෙරෙන් හේතුව කරා යාමේ ප්‍රතිඵලයකි. බෞද්ධ තර්ක ශාස්ත්‍රයට අනුව එය සප්‍රමාණ වූ පියවරක් ලෙස ගනු නොලැබේ. එසම කරුණක් වූ හේතුඵල සම්බන්ධතාවෙහි ස්වරූපය සම්බන්ධයෙන් මෙසේ බෞද්ධ හා බටහිර තර්ක ශාස්ත්‍ර අන්‍යොන්‍ය ප්‍රතිවිරුද්ධ මත දෙකක් දරන බවක් පෙනෙන අතර මෙම ලිපියෙහි දී අපගේ විමර්ශනයට පාත්‍රවන්නේ එසේවීමේ හේතු කවරේද යන්නය. එම හේතු තුළින් ධ්වනිත වන්නාවූ තාර්කික හා දාර්ශනික අර්ථ කවරේද යන්නද ඉතා වැදගත් කරුණක් වුවත් මෙහිදී ඒ පිළිබඳව සාකච්ඡා නොකෙරේ.

### ලිංගය

න්‍යායබින්දුකාර ධර්මකීර්ති පාදයන්ට අනුව ලිංගය හෙවත් සලකුණක් ආශ්‍රයෙන් කිසියම් කරුණක් පිළිබඳව නිගමනය කිරීම අනුමාන ඥානය නම් වේ. එම ඥානයෙහි පදනම වන්නේ ලිංගඥානය බව මින් පෙනී යයි. අනුමාන ඥානය සම්පූර්ණවීම සඳහා ලිංගය පිළිබඳ අවශ්‍යතා තුනක් එක් විය යුතුය. ත්‍රිරූපලිංගය යනුවෙන් හඳුන්වනු ලබන එම අවස්ථා තුන මෙසේය: